සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 07 - 2024**

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I කොටස

**01- 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් ගසන්න.**

01. දෙවියන් වහන්සේගේ පණිවිඩය ඉශ්‍රායෙල් ජනතාවට ප්‍රකාශ කරනු ලබන්නේ,
    i. රජවරුන් ය. ii. දිවැසිවරුන් ය. iii. ආදි පිතුරුවරුන් ය. iv. ජන නායකයින් ය.

02. සුළු දිවැසිවරයෙක් වන්නේ,
    i. යෙසායා ii. එසකියෙල් iii. ජෙරමියා iv. ජෝනා

03. දේව හඬ හඳුනා ගැනීමට අපට උදව් වන්නේ,
    i. දෙමව්පියන් ය. ii. සමාජ මාධ්‍ය ජාලා ය.
    iii. පක්ෂීන් හා මසුන් ය. iv. අහස හා ජලය ය.

04. නියං කාලයේදී දෙවියන් වහන්සේගේ දිව්‍ය සංරක්ෂණය අත්දුටු දිවැසිවරයා වන්නේ,
    i. ජෙරමියා දිවැසිවරයා ය. ii. යෙසායා දිවැසිවරයා ය.
    iii. එළියා දිවැසිවරයා ය. iv. එසකියෙල් දිවැසිවරයා ය.

05. එසකියෙල් දිවැසිවරයාගේ පියා වන්නේ,
    i. හිල්කියා ය. ii. බූසී ය. iii. ආමෝස් ය. iv. ජෝවෙල් ය.

06. සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා වන්නේ,
    i. ජෙරමියා ය. ii. එසකියෙල් ය. iii. යෙසායා ය. iv. ආමෝස් ය.

07. කානාන් දේශයට කියන වෙනත් නමක් වන්නේ,
    i. පොරොන්දු දේශය ii. මිසර දේශය iii. ගලීල දේශය iv. සිරියා දේශය

08. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇතිකර ගත් ගිවිසුමේ බාහිර සලකුණ වන්නේ,
    i. දේදුන්න ii. ගිනිහුල iii. චර්ම ඡේදනය යි iv. දෙපළු කල සතුන්

09. ආබ්‍රහම් යන්නෙහි අර්ථය වන්නේ,
    i. ජාතීන්ගේ පියා ය. ii. උතුම් පියා ය. iii. විශ්වාසයේ පියා ය. iv. දේශයේ පියා ය.

10. ඊසාක් තුමාගේ ජීවිතයෙන් ගත හැකි ප්‍රධාන ආදර්ශය වන්නේ,
    i. ඊර්ෂ්‍යා කිරීම ii. කළහ නොකිරීම iii. පරිසරයට ආදරය කිරීම iv. සත්ව හිංසනය

**අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11. නාමන්ගේ කුෂ්ඨ රෝගය ....................................... දිවැසිවරයා සුව කළේ ය.

12. ............................................ ආබ්‍රහම්තුමාට පරිත්‍යාග කිරීමට සිදු වූ දෙයකි.

13. ජේසුස් වහන්සේ අනුව ගිය ප්‍රථම ශ්‍රාවකයෙක් වන්නේ ...................................................................... .

14. ................................................. ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන ද්‍රව්‍යයකි.

15. පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටු කිරීමට සහය වන්නේ,.............................................................

(ජේදුරු තුමා ය, ගීතිකා කණ්ඩායමයි, සුදු වස්ත්‍රය, පියාගේ ගෘහය, එලීෂා, එලියා)

**අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. ඊසාක්ව රැගෙන ආබ්‍රහම්තුමා මොරියා දේශයට පිටත්විය. ( )

17. දෙවියන් වහන්සේගේ ගෘහය ''බෙතෙල්'' යන්න යි. ( )

18. කීකරුකම පැවිදි වේදභාරයකි. ( )

19. වියපත් වූ දෙමව්පියන්ට සැලකීම අනවශ්‍ය වේ. ( )

20. අවංකවීම සත්‍යගරුක සමාජයක් ගොඩනැංවීමට මග පාදන්නේ නැත. ( )

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. ලේඛක දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් 02ක නම් කරන්න.

ii. දේශක දිවැසිවරු දෙදෙනෙක් ලියන්න.

iii. කාර්මෙල් කන්ද මත යාග පූජා සිදුකළ පාර්ශ්ව 02ක නම් කරන්න.

iv. ප්‍රධාන දිවැසිවරු 02ක් නම් කරන්න.

v. ආබ්‍රහම් තුමා සමග ඇති කරගත් ගිවිසුමේ වැදගත් කරුණු 02ක නම් කරන්න.

vi. ඊසාක්තුමාගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

vii. ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා වන තෛල වර්ග 02 නම් කරන්න.

viii. පැවිදි නිකායන් බෙදෙන ප්‍රධාන කොටස් 02ක නම් කරන්න.

ix. ප්‍රසාද ස්නාපනයේ දී අපි කැඳවීම් ලබන තුන් ආකාර සේවා තුළින් 02ක් නම් කරන්න.

x. කිතුනු විවාහයේ ලක්ෂණ 02ක් නම් කරන්න. (ලකුණු 2 × 10 = 20)

02. i. පුරාණ ගිවිසුමේ දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න.

ii. ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා නම් කරන්න.

iii. දිවැසිවරුන් ලෙස ආලේප කර ඇති අපහට පැවරෙන වගකීම් 05ක් ලියන්න. (ලකුණු 2+3+5=10)

03. i. ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග දෙක නම් කරන්න.

ii. ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදු වූ දේවල් මොනවා ද? තුනක් නම් කරන්න.

iii. ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් කිතුණු ඔබට ගත හැකි ආදර්ශ 05 ලියන්න. (ලකුණු 2+3+5=10)

04. i. සුළු දිවැසිවරු 02ක් නම් කරන්න.

ii. ජෝනා දිවැසිවරයා ජීවත් වූ සියවස නම් කර මනස්ථාපනයට කැඳවීම සඳහා භාරවූ ජාතිය ලියා දක්වන්න.

iii. පහත අවස්ථාවල දී ඔබට කළ හැකි දිවැසිවර කාර්යය බැගින් ලියා දක්වන්න.

- දේවස්ථානය තුළ බාල සහෝදර සහෝදරියන් කෑකෝ ගසන විට
- පන්ති කාමරයේ දරුවෙකු කොන්වන විට
- පියා විදේශ ගතව ඔබේ මව තනිවම සහෝදර සහෝදරියන් බලා ගන්නා විට
- අයහපත් ලෙස දිවි ගෙවන මිතුරියකට
- පාසලේ දී දෙන පැවරුම් නොකරන මිතුරෙකුට මිතුරියකට (ලකුණු 2+3+5=10)

05. i. පූජකවරයෙහි ධූර 02ක් නම් කරන්න.

ii. පැවිදි වේදහාර 03ක් නම් කරන්න.

iii. පූජා ප්‍රසාදි වහන්සේලා වෙනුවෙන් අප විසින් ඉටු කළ යුතු යුතුකම් 05ක් ලියන්න. (ලකුණු 2+3+5=10)

06. i. පූජා ප්‍රසාදිවරු බෙදෙන ප්‍රධාන කොටස් 02ක් නම් කරන්න.

ii. පැවිදි නිකායන් 03 ක් නම් කරන්න.

iii. ගිහියන්ට පැවිදිවරුන්ගේ සේවාවනට සහායවිය හැකි ආකාර 05ක් ලියන්න. (ලකුණු 2+3+5=10)

07. i. විවාහයේ සාක්ෂිකරුවන් දෙදෙනා නම් කරන්න.

ii. දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් 03ක් ලියන්න.

iii. ශුද්ධ වූ පවුලෙන් කිතුනු පවුලකට ලබා ගත හැකි ආදර්ශ 05ක් ලියන්න. (ලකුණු 2+3+5=10)